# ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් පදිංචි රජයේ ඉඩම් සඳහා දීර්ඝකාලීන බදු බලපත්‍ර ලබාදීම.

- ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් වෙනුවෙන් ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021.02.09 දිනැති 2021/01 චක්‍රලේඛය අනුව පදිංචිය සඳහා සහනදායී ක්‍රමවේදයක් යටතේ රජයේ ඉඩම් ලබාදීමේ ව්‍යාපෘතියක් ආරක්ෂක අමාත්‍යාංශයේ සම්බන්ධීකරණයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමෙන් ක්‍රියාත්මක කරනු ලැබේ.

- මෙම චක්‍රලේඛය මගින් 2009.06.01 දිනට පෙර සේවයට බැදී ඇති රජයේ ඉඩම් වල පදිංචි රණවිරුවන්ට සහනදායී ක්‍රමවේදයක් යටතේ දීමනාපත්‍ර ලබා දීම සිදු කරන අතර අයදුම්පත් අදාළ හමුදාවේ/පොලීසියේ/ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සුභසාධක අංශ මගින් හෝ ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන්(www.defence.lk) ලබාගත හැකිය.

- 2021/01 චක්‍රලේඛය යටතේ 2009.06.01 දිනට පසුව සේවයට බැදී ඇති රණවිරුවන් සඳහා සාමාන්‍ය බදු ක්‍රමය යටතේ දීර්ඝකාලීන බදු ලබාදීම සිදු කරනු ලැබේ.

- මෙම චක්‍රලේඛය යටතේ ඉඩමේ නොදියුණු තක්සේරු වටිනාකමින් 10% ක් අයකර දීර්ඝකාලීන බදු බලපත්‍ර /දීමනාපත්‍ර ලබා ගැනීමට නිර්දේශ ලබාදීමට අදාළ අයදුම්පත සම්පූර්ණ කර අදාළ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව ඔවුන් අයත් අංශය/ඒකකය/ කොට්ඨාසය/රෙජිමේන්තුව හරහා පහත සඳහන් කාණ්ඩ වලට අයත් රණවිරුවන් ඔවුන්ට අදාළ ආයතන වෙත යොමු කළ යුතුය.

  I. යුද්ධ හමුදාවේ සේවයේ නියුතු රණවිරුවන් - යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය
  II. යුද්ධ හමුදාවේ ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය, අර්ධ වශයෙන් ආබාධිත හා විශ්‍රාමික රණවිරුවන් - රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය
  III. නාවික හමුදාවේ සියලුම රණවිරුවන් - නාවික හමුදා සුභසාධක අංශය
  IV. ගුවන් හමුදාවේ සියලුම රණවිරුවන් - ගුවන් හමුදා සුභසාධක අංශය
  V. පොලිස් නිලධාරීන් - පොලිස් සුභසාධක කොට්ඨාසය
  VI. සිවිල් ආරක්ෂක නිලධාරීන් - සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
  VII. ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී මියගිය, අතුරුදහන් වූ සහ පූර්ණ ආබාධිත තත්වයට පත් ත්‍රිවිධ හමුදා රණවිරු පවුල් සඳහා - රණවිරු සේවා අධිකාරිය

- ත්‍රිවිධ හමුදා සුභසාධක අංශ මගින් අයදුම්පත් යොමු කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් පිළිවෙලින් රෙජිමේන්තු, ඒකක, අනුඛණ්ඩ හා රණවිරුවන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

- යුද්ධ හමුදා සුභසාධක අධ්‍යක්ෂ මණ්ඩලය, රණවිරු සේවා අධ්‍යක්ෂ මණ්ඩලය, නාවික හමුදා සුභසාධන අංශය හා ගුවන් හමුදා සුභසාධන අංශය මගින් එම නිර්දේශිත දීර්ඝකාලීන බදු බලපත්‍ර/දීමනාපත්‍ර ලබාදීමට අදාළ අයදුම්පත් ආරක්ෂක අමාත්‍යාංශයේ සන්නද්ධ හමුදා සුභසාධන අංශය වෙත යොමු කළ යුතුය.

- සන්නද්ධ හමුදා සුභසාධන අංශයේ නිර්දේශය සහිතව අයදුම්පත් අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යොමු කරනු ලැබේ.

- රණවිරු සේවා අධිකාරිය, පොලිස් දෙපාර්තමේන්තුව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මගින් නිර්දේශ කරනු ලබන දීර්ඝකාලීන බදු බලපත්‍ර/දීමනාපත්‍ර අයදුම්පත් සෘජුවම අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමු කළ යුතුය.

- එම නිර්දේශිත අයදුම්පත් ප්‍රාදේශීය ලේකම්ගේ හා පළාත් ඉඩම් කොමසාරිස්ගේ නිර්දේශ සහිතව ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත අනුමැතිය සඳහා යොමු කරනු ඇත.